# දූප්පත්කම නිසයි අපි පැල් රකින්නේ

## ඉතිහාසයේ ගොඩ ගොවිතැන

අපි රටේ එද මෙන්ම අදද පවතිනුයේ කෘෂිකාර්මික නිෂ්පාදනය මුල්කරගත් ආර්ථික සාමාජික පරිසරයකි. ගොවිකම ගොඩ ගොවිතැන සහ මඩ ගොවිතැන වශයෙන් කොටස් දෙකකින් යුක්ත විය. මඩ ගොවිතැන වශයෙන් හැඳින්වූයේ වාරිමාර්ග පහසුකම් යටතේ කුඹුරුවල වී ගොවිතැන් කිරීමය. ගොඩ ගොවිතැන වශයෙන් හැඳින්වූයේ කුඹුරු නොවන අනෙකුත් ගොවිතැන්ය. සෑම ගමක්ම ගොවි පවුල් කිහිපයකින් යුක්ත වූ අතර ගොවිපවුලකට අඩංගු දේවල් හැටියට සලකනු ලැබූයේ කුඹුරු සහ ගොඩ ඉඩම්ය. ගොඩ ගොවිතැනට අයත්කූ දේවල් හැටියට සලකන ලද්දේ වතු, ගෙවතු සහ හේන් ගොවිතැන්ය. මෙම සම්ප්‍රදායික ගොවි පවුලක් බොහෝ දුරට ස්වයංපෝෂිත වූ අතර මුදල් අවශ්‍යවූයේ ඇඳුම් සහ ලුණු මිලදී ගැනීමටය. කුඹුරෙන් වීද වතුවලින් පොල් පුවක්ද ගෙවතු වලින් බුලත්, එළවළු සහ කුලු බඩුද හේන් වලින් අනෙකුත් ධාන්‍යය සහ එළවලු ආදීයද ලබා ගත්හ.

කැලය කැපීම, ගිනි තැබීම, වර්ෂාකාලයේ භෝග වගා කිරීම, කන්නයකට හෝ දෙකකට පසු එම ඉඩම අත්හැර දැමීම සහ ඊළඟ කන්නයේ වෙනත් කැලයක් කැපීම මෙම ගොවිතැන් ක්‍රමයේ ලක්ෂණයකි. දැනට සියවසකට පමණ පෙරදී පවා එකල බ්‍රිතාන්‍ය රජය හේන් ගොවිතැන් කිරීම නිසා ඇතිවන ස්වාභාවික හානිය ගැන දැන සිටියහ.

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

**ඩී. තෙන්නකෝන් විසිනි.**

කැලය, කැපීම, පිලිස්සීම, වැට බැඳීම ආදිය පළමු වැඩ කොටසයි. දෙවනුව බීජ ඉස උදැල්ලෙන් වපුරයි. කුරුල්ලන්ගෙන් සහ කෘමීන්ගෙන් වන හානි බහුල නිසා බීජ වැඩිපුර ඉසිනු ලබයි. සරු හේන්වල ඇල්වී වර්ග වගාකළ අතර නිසරු ඉඩම්වල බඩ ඉරිඟු, කුරක්කන් සහ මෙනේරි වගා කරයි. බොහෝ විට භෝග මිශ්‍රව වගා කරයි. කුරක්කන් ඇට – තණ ඇට – එළවලු ඇට – මිරිස් ඇට ආදිය මිශ්‍ර කර ඉසිනු ලබන අතර එම ඉඩ මෙම යාරයක පරතරයකින් බඩ ඉරිඟු සිටුවනු ලබයි. සාමාන්‍යයෙන් ධාන්‍ය අස්වැන්න එකට හත ළිහක් පමණ වේ. වර්ෂාව අඩුවන විට අස්වැන්න අඩුවීම නිතරම සිදුවේ. නියඟයෙන් පීඩා විඳීම හේන් ගොවියාට උරුමය. මේ නිසා මිශ්‍ර භෝග වගා කිරීමට ගොවියා පෙළඹව සිටී. බඩ ඉරිඟු සහ කුරහන් ප්‍රධාන භෝගය වේ. නියඟයෙන් ආරක්ෂාවීමට සහ සීඝ්‍රයෙන් වල් පැල වර්ධනයෙන් වන හානි අඩුකර ගැනීම සඳහා විශාල කැලෑ කැපීමට හේන් ගොවියා රුචිකත්වයක් දක්වීය. විශාල කැලෑ කපා සාද ගන්නා හේනක් සරුසාර හේනක් ලෙස නිතරම සලකනු ලැබීය. මෙම විශාල කැලෑ කපා ගන ලබන හේන මූකලන්හේන යනුවෙන් හඳුන්වනු ලැබීය. අත් දඩුවා හේන වශයෙන් නම් කළේ කවු මිශ්‍ර තරමක් විශාල මේරූ කැලෑ කපා ගන්නා හේන්ය. කුරහන් සහ බඩ ඉරිඟු සරුවට වැවෙනුයේ මෙම හේන් වල බව ඔවුන්ගේ විශ්වාසයයි. ලඳු හේන වශයෙන් නම්කරනු ලැබූයේ කවු පඳුරු කැලෑ කපා සාදගනු ලබන හේනය. මේ හේන් එතරම් සරු හේන් ලෙස ඔවුන් විසින් සලකනු ලැබුවේ නැත. හේන් ගොවිතැන අසීමිත ලෙස පැතිරී යෑම ස්වාභාවිකව පරිසරයට අහිතකර බව සත්‍යයකි. එහෙත් අති දුෂ්කර පරිසරයක, වර්ෂා හිඟය, අධික උෂ්ණත්වය, වැනි භෞතික සීමා වන් මැද හේන් ගොවිතැන් කිරීම හේන් ගොවියාගේ අත්‍යවශ්‍යම අංශය බවට පත්ව තිබේ.

මෙම සියවසේ මුල්භාගයේදී පවා ලංකාවේ දුෂ්කර දිස්ත්‍රික්ක වල හේන් ගොවිතැන බහුලව තිබුනි. එනම් නුවර කලාවිය (අනුරාධපුර දිස්ත්‍රික්කය) වන්නිය (වවුනියා දිස්ත්‍රික්කය) තමන්කඩුව (පොළොන්නරුව දිස්ත්‍රික්කය) වෙල්ලස්ස (අම්පාර දිස්ත්‍රික්කය) බින්තැන්න (මහියංගන දිස්ත්‍රික්කය) ඌව (බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කයන්) සහ දකුණු පළාත (හම්බන්තොට දිස්ත්‍රික්කය) වැනි ප්‍රදේශ වල බහුලව හේන් ගොවිතැන් කරන ලදී. මෙම දිස්ත්‍රික්ක වල පැරණි වාරිමාර්ග ක්‍රම නටබුන් වී තිබුන අතර, දියුණු කර තිබූ වැව් පවා අවුරුද්දේ වැඩි කාලයක් වියලී තිබුනි. මේ නිසා කුඹුරු වලින් කොටසක් අත්හැර දමන ලද අතර හේන් වගාව කෘෂිකර්මාන්තයේ අත්‍යාවශ්‍ය අංගයක් විය. මෙම සියවසේ මුලදී, නුවර කලාවිය (Kalaviya) ප්‍රදේශයේ ගම් 1570 ක් පමණ තිබුන අතර වැව් 1600 ක් පමණ තිබුනි. මේ වැව් බොහොමයක්ම ඉතා සුලු ඒවා වූ අතර දියුණු කර තිබුනේ ඉතා සුළු ප්‍රමාණයකි. දකුණු පළාත භාර රජයේ දිසාපතිගේ වාර්තාව අනුව 1872 පමණ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හේන් සඳහා ලැබුනු බදු සාපේක්ෂ වශයෙන් රජයේ සැලකිය යුතු ආදයම් මාර්ගයක් විය. එකල හම්බන්තොට පමණක් අක්කර 40,000 ක් පමණ හේන් ගොවිතැන් කරනු ලැබූ බව සලකනු ලැබේ. හේන් ගොවිතැන සුලු ගොවියාගේ අත්‍යාවශ්‍ය අංගයක් වූ නිසා, එය තහනම් කරනු වෙනුවට එය නීත්‍යානුකූල කිරීමේ ක්‍රමයක් 19 වන සියවසේ මුල සිට බ්‍රිතාන්‍ය රජය අනුගමනය කළ බව පෙනේ. විදන ආරච්චිලා විසින් තම කොට්ඨාසවල හේන් අවශ්‍ය ගොවි ලැයිස්තු පිළියෙල කළ යුතුය. එම ලැයිස්තු පත්තු භාර මුදලිවරු මගින් උපදිසාපති වරුන් වද, උපදිසාපති වරු මගින් පළාත භාර මහ දිසාපති වෙතද යැවේ. මෙම හේන් තේරීම, ඒවා බෙදදීම, බලපත්‍ර නිකුත් කිරීම සහ බදු මුදල් අයකිරීම දිසාපති සහ මුදලි වරුන්ගේ උපදෙස් පිට විදන ආරච්චිවරුන්ගේ කාර්‍යයක් විය.

## කැලෑ ආරක්ෂා කිරීම

අද තත්වය බලනවිට ඉඩම් ලබා ගැණීමේ දුෂ්කරතා වලට මුහුණ දීමට හේන් ගොවියාට සිදුවී තිබේ. නීතිරීති මගින් පමණක් මහ කැලෑ කැපීම තහනම් කළ නොහැකිය. මේ සඳහා ජනතාවගේ සහභාගීත්වය අවශ්‍ය වීය. මහ කැලෑ විනාශ කිරීම නිසා ඇතිවන පරිසර දූෂණ සහ එමගින් ඇතිවන ජාතික ප්‍රශ්න පිළිබඳව ගොවියාට අවබෝධයක් ලබා දිය යුතුය. අනෙක් අතට මෑත භාගයේදී මහ කැලෑ විනාශ කරන ලද්දේ හේන් ගොවියා විසින්ම නොවේ. වැඩි හරියක් කැලෑ විනාශවූයේ නගරවල සිට සංක්‍රමණයවූ මුදලාලිලාගෙනි. කැලෑ විනාශ කිරීම නිසා ඊළඟට පස් සෝද පාලුව සහ පස නිසරු වීම සිදුවිය. විශාල කැලෑ කපා එම කැලෑ දර සහ දැව දඩු සඳහා නගර වලට විකුණනු ලැබුවේ මෙම මුදලාලිලාය. මෙවැනි ක්‍රියා ඉදිරියටත් නොවීමට නම් සුළු ගොවියන්ගේ සහයෝගය ලබාගත යුතුය. තම ගමේ වන සම්පත් ආරක්ෂා කර ගැනීමට ඔවුන්ට ඇති අයිතිය අවබෝධ කර දිය යුතුය. ගමේ පරිසරය තම පොදු සම්පතක් සේ සලකා එය ආරක්ෂා කර ගැනීමට ගැමියා තුළ අදහස් ඇති කළ යුතුය.

රාජාණ්ඩු කාලවල දී පවා බොහෝ ගොවියන් හේන් ගොවිතැන් කළ බවට සාක්ෂි තිබේ. රාජාණ්ඩු කාලවලදී භූමියේ අයිතිය සම්පූර්ණයෙන් රජතුමා සතුවිය. භූපති යන නාමයෙන් පවා රජවරු හැඳින් වූයේ මේ නිසාය. එහෙත් රටවැසියාට තම ජීවත්වීම සඳහා භූමිය ප්‍රයෝජනයට ගැනීමට අවසර තිබුනු අතර රජු වෙනුවෙන් බලය පවරනු ලැබූ ප්‍රාදේශීය බලධාරීන් විසින් තම රටවැසියා භූමිය ප්‍රයෝජනයට ගන්නා ආකාරය කෙරේ නිතර විමසිළිමත් විය. සමහර ඉඩම් සඳහා රාජ්‍යය භාණ්ඩාගාරයට බදු ගෙවිය යුතුය. රජතුමාගේ කැමැත්ත පරිදි ප්‍රාදේශීය බලධාරීන් විසින් අනුමත කරනු ලැබූ කැලෑ ප්‍රදේශවල හේන් ගොවිතැන් කළ අතර ඒවායින් රජය බදු මුදල් අය නොකරන ලදී. රාජ්‍යය වනාන්තර සහ ආරක්ෂිත වනාන්තර හේන් ගොවිතැන් සඳහා හෙළිපෙහෙළි කිරීම තහනම්ය. බ්‍රිතාන්‍ය පාලන කාලයේදී පවා මෙම ක්‍රමය අනුගමනය කරන ලදී. රාජ්‍ය ඉඩම් සහ ආරක්ෂිත ඉඩම්වල හැර අනෙකුත් කැලෑ ඉඩම් වල හේන් ගොවිතැන් කිරීම නීත්‍යනුකූල කිරීම පිළිබඳ 19 වැනි සියවසේ අග කාර්තුවේ සිට බ්‍රිතාන්‍ය රජය පියවර කිහිපයක් ගන්නා ලදී. හේන් ගොවියන්ගේ ලැයිස්තු සකස් කිරීම, ඉඩම් බෙදා දීම, සහ බදු මුදල් අය කිරීම මෙම වැඩ පිළිවෙලයි. පරිපාලන නිලධාරීන් විසින් මෙම වැඩ පිළිවෙල හරියට ඉටු කිරීමට වග බලාගන්නා ලදී. මෙම වැඩ පිළිවෙල එක අතකින් පරිසරය ආරක්ෂා කිරීම සහ අනෙක් අතින් හේන් ගොවිතැන විධිමත් කිරීම සඳහාම විය.



ගොවිතැනේ ආරම්භය: වල් කෙටීම

## හේන් ගොවි ගැටලු

අද හේන් ගොවියා ද්වි ආකාර ගැටලුවකට හසුවී සිටී. එක අතකින් රැකියාවක යෙදීම අනෙක් අතින් එම වෘත්තිය රජයේ රෙගුලාසි මගින් නීතිවිරෝධී වීම. ලංකාවේ ගම් ප්‍රදේශවල වසරෙන් වසර ශ්‍රම හමුදාවට එක්වන ජනසංඛ්‍යාව අති මහත්ය. පාරම්පරික ආවේනිය අනුව ඔවුන් සම්පූර්ණයෙන්ම වාගේ (සියයට අනූ අටක් පමණ) කෘෂිකාර්මික අංශය ජීවන වෘත්තිය වශයෙන් තෝරාගනී. වෙනත් ජීවන වෘත්තියක් සඳහා පුහුණුවීමක් නොලබන ඔවුනට උරුමයෙන් ලැබෙන ගොවි පුහුණුව පමණක්ය වෘත්තිය සුදුසුකම ලෙස ඇත්තේ. ඔවුන්ගේ දෙමාපියන් සතු පුද්ගලික ඉඩම් දරුවන්ගේ ජීවන වෘත්තියට තරම් ප්‍රමාණවත් නොවන නිසා ඔවුන් ඊළඟට බලනුයේ රජයේ කැලෑ ඉඩම් දෙසය. රජයේ ඉඩම් අනවසරයෙන් වගා කිරීම නීති විරෝධී බව ඔවුහු හොඳාකාර දනිති. එසේම මෙම ඉඩම් ඔවුන්ගේ මුතුන් මිත්තන් විසින් කිසිදු බාධාවකින් තොරව භුක්ති විඳගත් ආ ඒවා බවද ඔවුහු හොඳාකාරව දනිති. අපේ ගැමියන් නිතර කියන්නාසේ කැලේ අල උරුම එම කැලේ වෙසෙන ඌරන්ටය. සම්ප්‍රදායික ඉඩම් භුක්තිය අනුව මෙම කැලෑ ඉඩම් උරුම එහි පරම්පරා ගණනක් වෙසෙන ගැමියන්ටය. රජයට ඉඩම් පාලනය නිසියාකාරව කිරීමට අවශ්‍ය නම් එම ඉඩම් වෙනුවෙන් සාධාරණ මුදලක් අය කිරීමේ අයිතිය රජයට තිබේ. එහෙත් එම ඉඩම් පරම්පරා ගණනක් භුක්ති විඳගෙන එන ගැමියනට තහනම් කිරීම යුක්ති සහගත විය නොහැකිය. පරිසරය ආරක්ෂා කිරීම අනෙක් ප්‍රශ්නයයි. ලංකාවේ තිබෙන සියලුම කැලෑ ආරක්ෂා කිරීම පරිසරය ආරක්ෂා කිරීම නොවේ. එසේනම් ගොවි ජනපද ව්‍යාපාර සඳහා රජය කොපමණ කැලෑ ඉඩම් හෙළිපෙහෙළි කරන්නේද? ආරක්ෂා කළ යුතු කැලෑ මොනවාද? කෘෂිකර්ම කටයුතු සඳහා යොදගත යුතු සංවර්ධනය කළ යුතු කැලෑ මොනවාද කියා තෝරා බේරා ගත යුතුය. අප මෙතෙක් සැලකිල්ලට නොගත් වැඩ පිළිවෙල මෙයයි කිව හැකිය. පසුගිය දශකය තුළ රජය හේන් බල පත්‍ර නිකුත් කිරීමට වැඩ පිළිවෙලක් සකස්කර ඇත. කම්මැලි නිලධාරීන් නිසා එය හරියාකාර ක්‍රියාත්මක නොවේ. අපගේ විමර්ශන කටයුතුවලට අනුව ග්‍රාමසේවා නිලධාරීන් සහ උපදිසාපති වරුන්ගේ ප්‍රමාද දෝෂ නිසා බලපත් නොලැබූ ගොවියන් අවසානයේ අනවසරයෙන් හේන් කරති. අනෙක් අතට බල පත්‍ර ගාස්තු ගෙවීමට අත මිට මුදල් නැති නිසා අනවසර හේන් වගා කරන ගොවියෝද සිටිති. මේ සඳහා යෝග්‍ය වැඩ පිළිවෙලක් සකස්කිරීමට දූන් අවශ්‍යව තිබේ.